# මාධ්‍ය නිවේදනයයි

2008-09-23

Visit our web site
www.tisrilanka.org

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of integrity

28/1, Bullers Lane, Colombo 07
Tel/Fax: 0112-501474, 0112-592287
Email: tisl@sltnet.lk
Web: http://www.tisrilanka.org

## ශ්‍රී ලංකාව දූෂණ තත්ත්ව දර්ශකයේ අනූ දෙවන ස්ථානයේ.....

දූෂණයට එරෙහි අරගලයන් මෙහෙයවන ප්‍රධාන විශ්ව සිවිල් සමාජ සංවිධානය වූ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය (TI) එළිදැක්වූ දූෂණ තත්ව දර්ශකයට අනුව ශ්‍රී ලංකාව රටවල් 180ක් අතුරින් 92වන ස්ථානය ලබා ඇත.

ශ්‍රී ලංකාව ලබා ඇති ලකුණු ප්‍රමාණය 3.2ක් වන අතර එය රාජ්‍ය අංශය තුළ බරපතල දූෂණ ප්‍රවණතාවන් පෙන්නුම් කරයි. භූතානය හැර අසල්වැසි රටවල් සියල්ල ලබා ඇත්තේ ලකුණු 3.5කට අඩු ප්‍රමාණයකි. ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය තුළ ප්‍රධාන ප්‍රශ්න ලෙස උපුටා දක්වා ඇත්තේ දේශපාලන පක්ෂයන්ට මුදල් සපයන මූලාශ්‍රයන්හි රහස්‍යභාවය හා පාර්ලිමේන්තුවේ දුර්වල අධීක්ෂණයයි. ලකුණු 3ට වඩා ලබා ඇත්තේ ඉන්දියාව (3.4) හා ශ්‍රී ලංකාව පමණක් වන අතර මාලදිවයින (2.8), නේපාලය (2.7), පාකිස්තානය (2.5) හා බංග්ලාදේශය (2.1) අඩු ලකුණු මට්ටමක තව දුරටත් පසුවේ. ඉන්දියාව ලබා ඇති ස්ථානයට හේතුව ලෙස විශ්ලේශකයන් දකිනුයේ තොරතුරු ලබාගැනීමේ අයිතිය සඳහා වූ පනත ක්‍රියාවට නැංවීමයි.

දූෂණ තත්ව දර්ශකයේ වැදගත්කම විස්තර කරමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ ජේ.සී. වැලිඅමුණ මහතා පවසන්නේ, ඒ ඒ රටවල රාජ්‍ය නිලධාරීන් හා දේශපාලඥයන් අතර කොතෙක් දුරට දූෂණය පවතින්නේදැයි දකින ආකාරයට බව මෙම දර්ශකය තුළ රටවල් පෙළ ගස්වන බවයි. එය සෑම රටකම දූෂණය ලකුණු 0 සිට 10 දක්වා වූ පරාසයක් තුළ මිනුම්කොට පිහිටුවයි. 10 වඩාත්ම සුපිරිසිදු වන අතර 0 ඉතාමත්ම දූෂිත වේ.

දූෂණ තත්ව දර්ශකය රාජ්‍ය අංශයේ දූෂණය පිළිබඳ අවධානය යොමු කරයි. මෙම දර්ශකය සඳහා දූෂණය අර්ථ නිරූපණය කරන්නේ පෞද්ගලික ලාභයක් සඳහා රාජ්‍ය තනතුර අයුතු ලෙස පරිහරණය කිරීමක් ලෙසයි. දර්ශකය සකස් කිරීමේදී භාවිත කළ සමීක්ෂණයන්වලදී පෞද්ගලික ප්‍රතිලාභ සඳහා රාජ්‍ය බලය අයුතු ලෙස භාවිතය පිළිබඳ ප්‍රශ්න කරන ලදී. මෙයට රාජ්‍ය නිලධාරීන් අල්ලස් ගැනීම, රාජ්‍ය අංශයේ මිලදී ගැනීම් වලදී කොමිස් ලබා ගැනීම හා රාජ්‍ය මුදල් අයථා පරිහරණය ඇතුළත්වේ. දූෂණ විරෝධි ප්‍රතිපත්තිවල ශක්තිමත්භාවය විමසන ප්‍රශ්නද ඊට ඇතුළත්වේ. 2008 දූෂණ තත්ව දර්ශකය එකිනෙකට වෙනස් මත විමසුම් 13ක් හා ස්වාධීන ආයතනයන් 11ක සමීක්ෂණයන් මත පදනම් වන අතරම, මූලාශ්‍ර ඉතාමත් ඉහළ ගුණත්මකභාවයකින් ලබා ගැනීමටත්, සමීක්ෂණ කටයුතු පූර්ණ සුපිළිපන්නතාවකින් සිදු කිරීමටත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය උත්සාහ ගෙන ඇත.

2008 දර්ශකය අනාවරණය කරන පරිදි යම් රටක් දුප්පත් හෝ පොහොසත් හෝ පෙරදිග හෝ අපරදිග හෝ යන සාධකය මත එහි දූෂණ තත්වය රඳා නොපවතී. දූෂණ මර්ධනය යන්න කැපවීමෙන් යුතුව විසඳිය යුතු කාරණයකි. දුප්පත් රටවල් අතරින් බාර්බඩෝස් (7.0), චිලී (6.9), ස්ලෝවේනියාව (6.7) සහ එස්තෝනියාව (6.6) ඉහළ ලකුණු ලබා ඇත. එම රටවල් දූෂණය මැඩලීම උදෙසා දැඩි ක්‍රියාමාර්ග ගෙන ඇත.

දර්ශකයේ අවසන් ස්ථානයන්හි පසුවනුයේ සෝමාලියාව (1.0), මියන්මාරය (1.3), ඉරාකය (1.3), හයිටි (1.4), ඇෆ්ගනිස්තානය(1.5) හා සූඩානය(1.6)යි. මීට හේතු ලෙස සලකන්නේ එම රටවල පවතින අභ්‍යන්තර හා බාහිර ගැටුම්ද හා ඒකාධිපති පාලනයන්ද වේ. මෙම තත්වය අභ්‍යන්තර ගැටුම් පවතින ශ්‍රී ලංකාව වැනි රටකට අනතුරු හඟවන තත්වයකි. 2008 ලයිස්තුවේ ඉහළින්ම ලකුණු 9.3ක් ලැබ නවසීලන්තය, ඩෙන්මාර්කය හා ස්වීඩනය පසුවන අතර ඊට ආසන්නයේ සිංගප්පූරුව (9.2), ෆින්ලන්තය (9.0) අයිස්ලන්තය (8.9) ස්ථාන ගතවී ඇත.

බර්ලිනයේදී නිකුත් කරන ලද පුවත්පත් නිවේදනයකින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්හි සභාපතිනි හුගෙට් ලබෙල් පවසා සිටින්නේ දූෂණය මැඩලීම උදෙසා පාර්ලිමේන්තවේ දැඩි අධීක්ෂණයත්, නීතිය බලාත්මක කිරීමත්, ස්වාධීන මාධ්‍ය හා ක්‍රියාකාරී සිවිල් සමාජයකුත් අවශ්‍ය බවයි. ඇය වැඩි දුරටත් පවසන්නේ මෙම ආයතන දුර්වල වීමත් සමග දූෂණය සාමාන්‍ය ජනතාවට හා පුළුල් ලෙස යුක්තියට සහ සමාජයීය සමානමත්මතාවට අනිසි ප්‍රතිඵල ඇති කරමින් පාලනය කළ නොහැකි ලෙස දෙගුණ තෙගුණ වන බවයි.

වැඩි විස්තර සඳහා කරුණාකර දුරකතන අංක 2592287 හෝ 2501474 අමතන්න.